8 වන පිටුවෙන්



සාරය ලෙස සිතා තමන්ගේ සදාචාරාත්මක සිරිත් විරිත්වලට අවමන් කරන අපේ බොහෝ ගැහැනුන් මෙම දුරාචාරී උපක්‍රම හිස් මුදුණින් පිළිගෙන ඇත.

අසාරය සාරය කොට ගත් බුද්ධි මන්ද මවුපියන්ගේ අහිංසක කුඩා දරුවන් යොදාගනිමින් ජාවාරම්කරුවන් විසින් සිදුකරනු ලබන මහා අපරාධය විද්‍යුත් මාධ්‍ය හරහා ම්ලේච්ඡාකාරයෙන් සිදු වන්නේ වුවද ඊට එරෙහිව පියවර ගැනීමට පාලන තන්ත්‍රයන්ද අපොහොසත්ය.

බටහිර දුරාචාරී සංස්කෘතික වෛරසය හේතුවෙන් අපේ පාලකයන්ගේ මොළ ගෙඩි රෝගාතුර වීම මේ නොමිනිස් රාජ්‍ය හා මාධ්‍ය දුරාචාරයේ ප්‍රධාන හේතුව වෙයි. මේ බියකරු වෛරසයට ප්‍රතිකර්මයක් ලබා දිය හැක්කේ වෛරසය හඳුනාගත හොත් පමණකි. ඒ වෛරසයෙන්ම රෝගාතුර වූ ජනතාව කෙසේ නම් සිය මතු පරපුරත්, රටත්, දැයත්, සසුනත් මුළුමණින්ම වනසා දමන්නා වූ මෙම බියකරු වෛරසය හඳුනා ගත්තද? කෙසේ හෝ බටහිර දුරාචාරී සංස්කෘතියෙන් හටගත් මෙම වෛරසයට අප්‍රමාදීව ප්‍රතිකාර නොකරන්නේ නම් ඉදිරි පනස් වසර තුළ වැනසී යන සිංහල ජාතියේ මතු පරපුරේ වහල් බවට වර්තමාන මාධ්‍යකරුවන් හා දේශපාලකයන් වග කිව යුතු වනවා පමණක් නොව කළ වරදට වන්දි ගෙවීමට ද සිදුවන බව අද අදම වටහා ගැනීම යහපත පිණිස වන්නේය.

පාපෝ පි පස්සති භද්‍රං - යාව පාපං න පච්චති
යාදාච පච්චති පාපං - අථ පාපෝ පාපාන පස්සති

පාපය නොපැසවන තාක් පව්කාරයාද යහපත දකින්නේය. යම් දිනෙක පාපය පැසවයිද එකල පාපියා පාපයෙහි රඟ දකින්නේය.

■

# තොප රුව ලත් හසත් සත් සැපත රැක සැප දේ

තොප රුව ලත් හසත්
සත් සැපත රැක සැප දේ

හංස සන්දේශයේ එන මේ පද්‍යයේ "තොප රුව ලත් හසත්" යනු "තොප (හංසයා) ගේ" රූපය සහිත මුද්‍රාවයි. රජුගේ මුද්‍රාවට ගැනුණේ හංස රූපය නිසා රාජ මුද්‍රාව "හස්" යන නම ලැබී ය. හස් ඔබ්බා (ඔබ්වා) යන්නේ තේරුම මුද්‍රා (සීල්) තබ්බා (තබ්වා) යන්න ම යි.

ඉඩමක් පවරා දීමේ දී එම ලියැවිල්ලට ඔප්පු යන දෙමල වචනය අපි භාවිතා කරමු. එදා මුලු රටම (භූමිය ම) රජුට අයත් සේ සැළකුණ නිසා පින් තකා (සසුනට) සංඝයාට ද, පක්ෂපාතීත්වය සළකා ගිහියන්ට ද, ගම් බිම් පවරා දීම (තෑගි කිරීම) රජුගේ සිරිත විය. ඒ සඳහා රජු දෙන ලියැවිල්ලට අස්සන වෙනුවට යොදන ලද්දේ හංස රූපයකි. ඒ හංස මුද්‍රාව "හස් සන" විය. "හස්සන" පද පෙරළියකින් "සන්හස" යන තනි පදය බවට පත් විය. "රන් මසු" දෙපදය "මසුරන්" යයි තනි පදයක් වූවාක් මෙනි.

"සන්හස" අනතුරුව පූර්ව රූප විධියෙන් "සන්නස" වී තේරුම ද වෙනස් විය.

ගල් පුවරුවක, තඹ රන් පතක ලියූ ලියවිල්ලක අස්සන් තැබිය නොහැක. එහෙයිනි අස්සන වෙනුවට "හස්සන" (හස් සන) තබන ලද්දේ සන්නස යන්නේ, ලියැවිල්ල. සහතිකය. ඔප්පුව යන තේරුම් ඇති බව පෙනේ.

**වි ක. ධර්මබන්ධු**

බටහිර ඔස්ට්‍රේලියාව

> "සන්හස" අනතුරුව පූර්ව රූප විධියෙන් "සන්නස" වී තේරුම ද වෙනස් විය.









First 25 words - $20.00 .
For each additional word $1.00

පළමු වචන 25 සඳහා ඩොලර් 20.00
අතිරේක වචනයක් සඳහා ඩොලර් 1.00

**Sannasa**
PO Box 172 Reservior
VIC 3073 Australia
email: info@sannasa.net

0425 720 932
0422 671 826
03 9796 4241

## VEHICLES FOR SALE

VL කොමඩෝර් (රතු) 88 ඔටෝ/ඒසී පවර් සිටියරිං, ඇලෝයි වීල්, CD ප්ලේයර්, V/Good RWC 12 Months Rego $2990 onp.
9708 6751 හෝ 0414 864027

මිට්සුබිෂි ලාන්සර් 98 Auto/AC පවර් සිටියරිං Lady Owner. RWC. Low km. $10,000 ono
03 9796 4241

නිසාන් ස්කයි ලයින් (තද නිල්) 95 Turbo GTST R 33 ජපානයෙන් ආනයනය කරන ලද මැනුවල් ඇලෝ වීල් CD ප්ලේයර් Low KM $17200 ono.
9702 4181 හෝ 0425 727 529

ෆෝඩ් ෆැල්කන් 84 Auto/Ac පවර් සිටියරිං Gas/Petrol $2500 0425

## OFFICE QUIPMENTS

ඉතා හොඳ තත්වයේ Lexmark ලේසර් ප්‍රින්ටරයක් විකිණීමට ඇත $90.00
විමසන්න
0425 866 486

## AUTO CARE

ඔබේ වාහනයේ ඕනෑම අලුත්වැඩියාවක් සඳහා අප අමතන්න
**ස්පොට් ඔන් මොබයිල් මිකැනික්**
147 ග්‍රීන්වේල් ඩ්‍රයිව්
ග්‍රීන්වේල්
9333 4346
04210285 181